පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය යුරෝපා ඉතිහාසය II ( I කොටස) 25 S I

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය :

| | | | | |
|---|---|---|---|---|
| 1) 03 | 2) 02 | 3) 05 | 4) 05 | 5) 01 |
| 6) 04 | 7) 05 | 8) 02 | 9) 02 | 10) 03 |
| 11) 01 | 12)03 | 13)02 | 14)03 | 15) 02 |
| 16) 04 | 17) 04 | 18) 01 | 19) 03 | 20) 04 |
| 21) 04 | 22) 04 | 23) 04 | 24) 02 | 25) 05 |
| 26) 03 | 27) 01 | 28) 02 | 29) 03 | 30) 05 |
| 31) 04 | 32) 05 | 33) 02 | 34) 03 | 35) 04 |
| 36) 01 | 37) 02 | 38) 01 | 39) 05 | 40) 01 |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 12


විෂයය :- යුරෝපා ඉතිහාසය II (II කොටස) | 25 | S | II

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය :

## A කොටස

01)



## B කොටස

02) i) නගර කේන්ද්‍ර කරගත් ස්වාධීන රාජ්‍ය ලෙස පැවතීම. (නිදසුන් :- ඇතැන්ස්, ස්පාටා, කොරින්ත්, තීබ්ස්, ආගෝස්, සමෝස්, මිලේටස්, ඩිලෝස්, මෙගාරා)

- ප්‍රමාණය අතින් තරමක් කුඩා වීම.
- සාපේක්ෂ වශයෙන් අඩු ජන ගහනයකින් යුක්ත වීම.
- සමාජය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වීම - පුරවැසියන්, විදේශිකයන් හා වහලුන් (ඇතැම් තැනක ස්ත්‍රීන් වෙනම කණ්ඩායමක් වශයෙන් දක්වා ඇත.)
- පුරයේ සියලු ආකාරයේ වරප්‍රසාද පුරවැසියන් විසින් භුක්ති විඳින ලද අතර වහලුන් ශ්‍රමිකයන් වීම.
- ආණ්ඩුක්‍රම විවිධත්වය - රාජාණ්ඩු, ප්‍රභූ තන්ත්‍ර, කතිපයාධිපති, ප්‍රජා පීඩක හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍ර.
- කෘෂිකර්මාන්තය හා වෙළඳාම ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වීම.

ii) ආගම

- විවිධ දෙවියන් හටපුද පූජා පවත්වා, ඔවුන්ගේ පිහිටාධාර පැතීම පුළුල් වශයෙන් ගත්විට ග්‍රීක ආගම ලෙස සැලකිය හැකිය.
- ග්‍රීකයන් අතර බහුදේවවාදයක් පැවතීම.ග්‍රීක දෙවි පරපුර සියුස් (ආකාශ දෙවියා - දෙවි පරපුරේ ප්‍රධානියා), ඇපලෝ (හිරු දෙවියා - බුද්ධිය සමාජ සම්බන්ධතා නීතිය හා සාමය), ආටිමීස් (සඳු දෙවගන), අෆ්‍රොඩයිටී (ආලය), ඇතීනා (ප්‍රඥාව, ඇතැන්ස් හි ආරක්ෂක), පොසිඩන් (මුහුද)
- මෙම දෙවිවරුන් ඔලිම්පස් කන්දේ වාසය කරතියි විශ්වාස කිරීම.
- මොවුන් මිනිසුන් මෙන් ක්‍රියා කරන බව විශ්වාස කිරීම.
- මොවුන් මිනිසුන් මෙන් ක්‍රියා කරන බව විශ්වාස කිරීම මිනිස් ගුණාංග ඔවුන් වෙත ආරෝපණය තිබීම.
- දෙවි පරපුර ග්‍රීක ලෝකයට පොදු වීම.(එක්තරා අන්දමක ආගමික එක්සත්භාවක්)
- ග්‍රීක ආගමික නිදහස් චින්තනයට බාධාකාරී නොවීම හා විවිධ කලාවන්ට අනුබල දීම කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
- ග්‍රීක කලාව මානවවාදය (ලොව වාසය කරන සියලු සතුන් අතුරෙන් උතුම්ම සත්වයා ලෙස මිනිසා අගය කිරීම) හා ස්වභාවිකත්වය පිළිබිඹු කිරීම.
- සාමාන්‍ය මින්සුන්ගේ ප්‍රතිමා ද ඇති නමුත් වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ දේව ප්‍රතිමාය.එහෙත් එම දේව ප්‍රතිමා ද මිනිස් ගති ලක්ෂණ වලින් යුතුව නිර්මාණය කර තිබිම.
- ඇතැන්ස් රාජ්‍යයේ ඇක්‍රෝපොලිස් කඳු මුදුනේ නිර්මාණය කොට ඇති පාර්තිනොන් දේවස්ථානය(ඇතීනා දේවගනගේ දෙවොල)
- ඩොරික් (පාර්තිනොන්),ඉයොනික් හා කොරින්ජියන් ගෘහ නිර්මාණ ශෛලීන්
- ප්‍රතිමා(පාර්තිනොන් හි ඇතීනාගේ ප්‍රතිමාව සියුස්ගේ දෙවොලේ සියුස්ගේ ප්‍රතිමාව)
- විශිෂ්ටතම ග්‍රීක ප්‍රතිමා ශිල්පීන්,ෆිඩියාස්(ඇතිනා,සියුස්),මයුරොන් (කව පෙත්ත විසි කරන්නා),ප්‍රැක්සිටිලීස්(ළදරු ඩයනීසස් අතැතිව සිටින හර්මීස්ගේ ප්‍රතිමාව)

03) I) පුනරුදය මුලින්ම ඇතිවුයේ ඉතාලියේ ය.

- ඉතාලියේ ආර්ථික,සාමාජයික,පරිසරය පුනරුදය ඇතිවීම කෙරෙහි බලපෑම,වැඩවසම් ක්‍රමය පිරිහීම,වෙළඳාම දියුණු වී,වෙළඳ නගර වර්ධනය වී,ධනවත් මධ්‍යම පන්තියක් බිහි විම,මෙම පන්තියද ඉතාලි පෞර රාජ්‍යවල සිටි කුමාරවරුන්ද, ඇතැම් පූජකයන් ද කලා අංශවල දියුණුවට අතහිත දීමට ඉදිරිපත් වීම.
- 12 වන හා 13 වන සියවස් වල විශ්ව විද්‍යාල බිහි වීම.
- කොන්ස්තන්තිනෝපලයේ සිට ග්‍රීක රෝම පොත පත හා දැනුම ඉතාලියට ගලා ඒම 1453 කොන්ස්තන්තිනෝපලයේ වැටීම.

II) ග්‍රීක හා ලතින් භාෂා වල ප්‍රබෝධයක් ඇති වීම,මානව වාදය නැගී ඒම, භාෂා හා මානව ශාස්ත්‍ර හැදෑරීම දියුණු වීම.

- කලාව සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇති වීම,ගෘහ නිර්මාණ ශිල්පය,ප්‍රතිමා කලාව,චිත්‍ර කලාව යන අංශ ග්‍රීක රෝම සම්ප්‍රදායන්ට නැඹුරු වීම හා ඒ අංශ වල ඇති වූ ප්‍රබෝධය හා වර්ධනය,පුනරුද කලාකරුවන්ගේ කෘතීන්.
- පුනරුද කලාව ස්වභාවිකත්වයට හා ලෞකිකත්වයට වඩාත් නැඹුරු වීම.
- විද්‍යාව සම්බන්ධයෙන් ඇති වූ දියුණුව, සූර්ය කේන්ද්‍රවාදය, කොපර්නිකස්, කෙප්ලර්, ගැලීලියෝ යන අයගේ සොයාගැනීම්.
- භෞතික විද්‍යාවේ හා වෛද්‍ය විද්‍යාවේ නව සොයාගැනීම්.

04) I)

- ❖ ආගමික
- කතෝලික සභාවේ දූෂණ හා එහි පිරිහීම, පාප්වරුන් කිහිපදෙනෙක් පත්වීම හා ඔවුන් අතර ගැටුම් ඇති වීම, ඇතැම් පාප්වරුන් සුඛෝපභෝගී ජීවිත ගත කරමින් ලෞකිකත්වයට නැඹුරු වීම, කතෝලික සභාව ප්‍රතිසංවිධානය කළ යුතු බවට අදහස් හා උද්ඝෝෂණ ඇති වු නමුත් ඒවාට එම සභාව සවන් නොදීම.
- පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස පූජකයන් නොවන අන් අයට ද බයිබලය කියැවීමේ අවස්ථාව හා හැකියාව ලැබීම හා පාප්වරුන් හා පූජකයන් ගත කරන ජීවිත ආගමික ඉගැන්වීම් වලට පටහැනි බව පෙනීයාම.
- ❖ දේශපාලන
- යුරෝපයේ ජාතික රාජ්‍ය නැගී ඒම හා ඒවායේ පාලකයින්, සිය රටවල ක්‍රිස්තු සභාවට හා පූජකයන්ට තිබූ බලය නොයිවසීම, ජර්මනිය තුළ ශුද්ධ රෝම අධිරාජ්‍ය හා ප්‍රාදේශීය කුමාරවරුන් අතර පැවති දේශපාලන ගැටුම.

II) මාටින් ලූතර්

- 1485 ජර්මනියේ තියුරිංගියාවේ මාටින් ලූතර් උපත ලැබීම.
- මව බැතිමත් කිතුනු කාන්තාවක් වූ බැවින් ලූතර් කුඩා කල සිටම ආගමික බලපෑමට ලක් වීම.
- මුලින් නීතිය හදාරා පසුව දේව ධර්මය හා දර්ශනය ඉගෙන ගැනීම.
- 1511 දී විටෙන්බර්ග් විශ්ව විද්‍යාලයේ දේව ධර්මය පිළිබඳ මහාචාර්ය ධූරයක් දැරීම.
- පල්ලියේ ඉගැන්වීම් පිළිබඳ ප්‍රශ්න කිරීම.
- පූර්ණඵල පත්‍රිකා විකිණීමේ ව්‍යාපාරය දැඩි ලෙස විවේචනය කිරීම.
- 1517 පාප් වහන්සේගේ, ප්‍රධාන පූජකවරුන්ගේ ඉගැන්වීම් ප්‍රශ්න කරමින් විටෙන්බර්ග් දේවස්ථාන දොරටුවේ කරුණු 95 කින් යුත් ලියවිල්ලක් ඇලවීම.
- සැක්සනියේ පාලක ෆෙඩ්රික් ප්‍රධාන ප්‍රාදේශීය පාලකයන්ගෙන් ලූතර්ට ආධාර ලැබීම.
- 1520 දී ලූතර් මිසදිටුවකු ලෙස ප්‍රකාශ කර තකෝලික සභාවෙන් නෙරපීම.
- 1521 දී ලූතර් වර්ම්ස් හි ඩයට් සභාවට සිය දුර්ලබ්ධිය අත්හරින ලෙස ශුද්ධ රෝම අධිරාජ්‍යයා ඉල්ලා සිටීම සහ ලූතර් එය ප්‍රතික්ෂේප කිරීම.
- ලූතර් දහම ජර්මනිය පුරා සීග්‍රයෙන් පැතිර යාම.
- අනතුරුව කතෝලික සභාවට විරුද්ධව ප්‍රොතෙස්තන්ත්‍ර රෙපරමාදු ව්‍යාපාරය ඇති කිරීමට මූලිකත්වය ගැනීම.

05) I) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම.

- 1618 සිට 1648 දක්වා කාලය තුළ ඇතිවූ තිස් අවුරුදු යුද්ධය අවසාන කරමින් ඇතිකර ගන්නා ලද වෙස්ට්ෆේලියා සාම ගිවිසුම යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සලකණු ලැබේ.
- ප්‍රංශය, යුරෝපයේ බලවත් රාජ්‍යයක් බවට පත් වීම.
- ශුද්ධ රෝම අධිරාජ්‍ය නාමික තත්වයට පත් වීම, ජර්මන් කුමාරවරුන්ගෙ බලය වර්ධනය වීම, එක්සත් ජර්මන් රාජ්‍යයක් බිහිවීම තවත් සියවස් දෙකකින් ප්‍රමාද වීම.
- කැල්වින් වාදය පිළිගනු ලැබීම.
- යුරෝපයේ හටගත් අවසාන ආගමික යුද්ධයේ අවසානය සලකුණු කිරීම.

II) රාජාණ්ඩුව.

- පීතෘමූල සමාජයක් පැවති රෝමවරුන් අතර මුල් අවස්ථාවේදී පැවතියේ රජ කෙනෙකු මුල් කරගත් රාජාණ්ඩු ක්‍රමයකි.මෙම ආණ්ඩුක්‍රමය ක්‍රි.පූ.753 පමණ සිට ක්‍රි.පූ.510 දක්වා ක්‍රියාත්මක විය.
- රජුට විශාල බලතල පමණක් හිමිව තිබූ නමුත් එම බලතල සම්ප්‍රදාය මගින් සීමා කිරීමක්ද දක්නට ලැබීම(රජුට පහළින් පැවති වැඩිහිටි සභාව හෙවත් සෙනට් සභාව මගින්)
- රජුගේ බලතල හා කාර්යන්,ප්‍රධාන පූජකයා,ප්‍රධාන විනිශ්චකාරයා හා හමුදා නායකයා වීම,සියලු නිළධාරීන් රජු විසින් පත් කිරීම,එසේ වූවත් වැදගත් කරුණු සම්බන්ධ තීරණ ගැනීමේ දී සෙනට් සභාව විමසිය යුතු වීම.
- රජකෙනෙකුගේ පත්වීම ජනතාව විසින් අනුමත කළ යුතුව තිබූ නමුත්,ඔහු බලයෙන් පහ කිරීම කිසිවෙකුටත් අයිතියක් නොතිබිණි.
- රජු හා සෙනට් සභාවට අමතරව මහජන සභාවක් පැවතිණි.යුධ සේවයට සුදුසු සියලු පුරුෂයන් එහි සාමාජිකත්වය දැරීය.
- මෙකල දේශපාලන අයිතිවාසිකම් පැට්‍රිෂියන්වරුන් හෙවත් ඉඩම් හිමි ප්‍රභූ පැලැන්තියට පමණක් හිමිව තිබූ අතර ඔවුන් විසින් අවසන් රෝම රජු  වූ එට්‍රස්කන් වර්ගයට අයත් ටාර්ක්වින් පලවා හරිනු ලැබ සමූහාණ්ඩුවක් පිහිටු වීම.

III) වැඩවසම් ක්‍රමයේ පිරිහීම.

වැඩවසම් ක්‍රමය යනු කවරේදැයි ඉතාම කෙටියෙන් හඳුන්වා දී තිබීම වැදගත්. මධ්‍යතන යුගයේ යුරෝපයේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලන ක්‍රමය "වැඩවසම් ක්‍රමය" නමින් හඳුන්වනු ලැබේ. 15 හා 16 සියවස් වල එම  ක්‍රමය පරිහානියට පත් වීම ආරම්භ විය. ඒ සඳහා හේතු ගණනාවක් බලපෑවේය.

- කුරුස යුද්ධය සඳහා යුරෝපීයයන් සහභාගී වීම අතුරු ඵලයක් ලෙස වෙළඳාම වර්ධනය වීම.
- ඇතැම් බණ්ඩාරගම් අතිරික්තයක් නිශ්පාදනය කිරීමට පෙළඹීම හා ස්වයංපෝෂිත ලක්ෂණ දුර්වල වීම.
- මුදල් භාවිතය පැතිර යාම හා වාණිජ මධ්‍යම පන්තියේ නැගීම.(වැඩවසම් ක්‍රමය මුදල් විසින් දියකර හරිනු ලැබුවේය යන අදහස.)
- නගර බිහි වීම.
- ජාතික රාජ්‍ය වල නැගීම.
- මහාමාරිය වසංගතය.

IV) පෘතුගීසීන් විරුද්ධ වූ දේශ ගවේශණ.

- තුර්කි බල ව්‍යාප්තිය හේතු කොට ගෙන යුරෝපයේ සිට පෙරදිගට වැටී තිබූ ගොඩබිමව වෙළඳ මාර්ග අවහිර වීම මුහුදු මාර්ග සෙවීමට යුරෝපීයන් පෙළඹවීම.
- පෘතුගාලයේ සමුද්‍රාසන්න පිහිටීම.
- නාවික හෙන්රිගේ දායකත්වය(සාග්‍රේස්හි නාවික ශිල්පය පිළිබඳ අධ්‍යාපන මධ්‍යස්ථානය ක්‍රමානුකූල සිතියම් නිර්මාණය.)
- වෙළඳ අරමුණු.
- කතෝලික දහම ව්‍යාප්ත කිරීමේ අරමුණු.
- ප්‍රධාන මුහුදු ගමන්,
    - බටහිර අප්‍රිකාවේ ගෝල්ඩ්කෝස්ට් හා කොංගෝ නදියේ මුවදොර තෙක් යාත්‍රා කිරීම.
    - බර්තෝලමියු දියෙස් සුබ පැත්මේ තුඩුව දක්වා යාත්‍රා කිරීම.
    - වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩ බැසීම.
    - කබ්රාල් බ්‍රසීලයට යාත්‍රා කිරීම.
    - බ්‍රසීලයේ බලය පිහිටුවා ගැනීම.
    - ආසියාවේ ඉතා පුළුල් ප්‍රදේශයක විසිරී ගිය කුඩා ස්ථාන වලින් යුත් පෙරදිග අධිරාජ්‍යයක් ගොඩනැගීම.

**C** කොටස

06) (I)

- එංගලන්තයේ විදේශ වෙළඳාම පුළුල් වී යාම.
- භාණ්ඩ ඉල්ලුම වැඩි වීම හා නිෂ්පාදනය පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව මතු වීම.
- එංගලන්තය තුළ විද්‍යාත්මත හා තාක්ෂණික ඥානය හා දැනුම වර්ධනය වී තිබීම.
- වෙළඳාම වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මූලධනයක් උපයාගෙන සිටි ධනවතුන් පිරිසක් බිහි වීම.
- කාර්මික විප්ලවය(දෙවැනි ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය)නිසා ඉඩම් අහිමි හා රැකියා විරහිත පිරිසක් බිහි වීම හා ඔවුන් රැකියා සොයාගෙන නගර වලට සංක්‍රමණය වීම.

(II)

- තාක්ෂණ විද්‍යාමය
  - දුවන නඩාව (ජෝන් කේ)
  - ස්පිනිං ජෙනිය (ජේම්ස් හාග්‍රීව්ස්)
  - ජලරාමුව (රිචඩ් ආක්රයිට්)
  - ස්පිනිං මියුල් (සැමුවෙල් ක්‍රොම්ප්ටන්)
  - පර්වලුම් (එඩ්මන්ඩ් කාර්ට්රයිට්)
  - වාෂ්ප එන්ජිම (තෝමස් නිව් කොමන් හා ජේම්ස් වොට්)
  - ආරක්ෂක ලාම්පුව (හම්ප්‍රි ඩේවි)
  - දුම් බෝට්ටුව (රොබට් පුල්ටන්)
  - දුම්රිය එන්ජිම (ජෝර්ජ් ස්ටීවන්සන්) ආදී නවෝත්පාදන බිහි වීම.

- ආර්ථික
  - නිෂ්පාදන මාර්ග වල මූලික පරිවර්තනයක් ඇති වීම.
  - කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකයක් වෙනුවට කර්මාන්ත පදනම් කොටගත් ආර්ථිකයක් බිහි වීම.
- සමාජ
  - කාර්මික ධනහිමි හා කම්කරු යනුවෙන් නව සමාජ පන්ති බිහි වීම.
  - ජනගහන ව්‍යාප්තියේ වෙනසක් ඇති වීම.
  - පරිසර දූෂණය.
  - මුල් යුගයේ කම්කරුවන්ට අතිශය අයහපත් තත්වයක් යටතේ සේවය කිරීම සිදු වීම ඉතාමත් දුක්බිත ජීවිත ගත කිරීමට සිදු වීම.

07) (I)

- ආර්ථික සාධක
  - එංගලන්තය උතුරු ඇමරිකාවේ ඉංග්‍රීසි ජනපද විෂයයෙන් අනුගමනය කළ වාණිජවාදී ප්‍රතිපත්තිය.
  - එම ප්‍රතිපත්තිය නාවික පනත් හා වාණිජ නීති මඟින් ක්‍රියාවට නැංවීම.
    - * මව්රටේ නිපදවන ඇතැම් භාණ්ඩ ජනපදවල නිපදවීම තහනම් කිරීම.
    - * නම් කළ භාණ්ඩ මව් රටට පමණක් අලෙවි කිරීම.
    - * ජනපද වල භාණ්ඩ ප්‍රවාහනයට මව් රටේ නැව් පමණක් යොදා ගතයුතු වීම.

➢ දේශපාලන සාධක

- මව්රට ගෙන ගිය මර්දනකාරී බදු ප්‍රතිපත්තියට ක්‍රමයෙන් ජනපදවාසීන් එරෙහි වීම.
- සත් අවුරුදු යුද්ධයෙන් පසුව ජනපද වලට තව දුරටත් ඉංග්‍රීසි හමුදා ආරක්ෂාව අවශ්‍ය නොවීම.
- එංගලන්ත පාර්ලිමේන්තුව තවදුරටත් නව බදු පැනවීම හා ඒවා දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම. - ටවුන්ෂෙන්ඩ් පනත(මුද්දර බද්ද,තේ බද්ද)
- ඇතැම් බදු ජනතා විරෝධය හමුවේ වලංගු කළ නමුත් මව් රටට ජනපදවලින් බදු අය කිරීමේ අයිතිය ඇති බව අවධාරණය කරමින් එංගලන්ත පාර්ලිමේනතුව තේ බද්ද අවලංගු කිරීම ප්‍රතික්ෂේප කිරීම.
- විරෝධය දේශපලපාලන නිදහස ලබා ගැනීමේ ඉලක්කයක් දක්වා වර්ධනය වීම.("නියෝජනයක් නැතිනම් බදුත් නැත")
- බොස්ටන් තේ සාදය.

08)

i)

➢ දේශපාලන

- බලය කේන්ද්‍රගත කරන ලද ඒකාධිපති රාජාණ්ඩුව,රිචලියු හා මැසරින් රදළයන් සතු ප්‍රාදේශීය බලය ඔවුන් වෙතින් ඉවත් කොට කිරීටය වෙත පැවරීමටත්,මධ්‍යම ආණ්ඩුව වෙත පරිපාලනය කේන්ද්‍ර ගත කිරීමටත් පියවර ගැනීම,විප්ලවාසන්න සමයේ පැවති අකාර්යක්ෂම පාලනය.

➢ ආර්ථික

- කෘෂිකර්මාන්තය පදනම් කරගත් වැඩවසම් සම්බන්ධතා මත සංවිධානය වූ ආර්ථිකය,වෙළඳාම පුළුල් වී තිබීම,ඉඩම් කොටු කිරීම,විප්ලවාසන්න සමයේ ඇති වී තිබූ මූල්‍ය අර්බුදය.

➢ සමාජ

- ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකින් සමන්විත වීම - පූජකයන්,රදළයින්,හා සාමාන්‍ය ජනතාව(මධ්‍යම පන්තිය,ගොවි ජනතාව හා නාගරික කම්කරුවන්) මෙම සමාජ කොටස් මුහුණ දුන් විවිධ ප්‍රශ්න හා ඔවුන්ගේ දුක් ගැනවිලි,විශේෂයෙන් සාමාන්‍ය ජනතාවගේ දුක් ගැනවිලි ප්‍රංශ විප්ලවය ඇති වීම කෙරෙහි බලපෑම,පූර්ව විප්ලවීය ප්‍රංශයේ ජීවත් වූ දර්ශන්තයන්(වෝල්ටෙයාර්,මොන්ටෙස්ක්‍යු හා රූසෝ) හා ඔවුන්ගේ අදහස් විප්ලවය ඇතිවීමට බලපෑ අන්දම.
- ඇමෙරිකානු නිදහස් සටනේ බලපෑම.
- මූල්‍ය අර්බුදය

09)

i) දාහතරවන ලුවී රජතුමා

➢ මෙම රජු 1643 දී ප්‍රංශ රජ තනතුරට පත් වූ නමුත් මුලදී ප්‍රංශයේ රාජ්‍ය කටයුතු සැබෑ වශයෙන් මෙහෙයවන ලද්දේ මැසරින් විසින්.

➢ මොහු ප්‍රංශයේ සැබෑ පාලකයා වශයෙන් කටයුතු කරන්නට පටන්ගන්නේ 1661 මැසරින් මියගිය පසුවයි.

➢ 1715 තෙක් දාහතරවන ලුවි රාජ්‍ය පාලන කටයුතු මෙහෙවිය.

➢ යුරෝපයේ එවකට පැවති බලවත්ම රාජ්‍ය වූ ප්‍රංශයේ දැඩි ඒකාධිපති පාලනයක් ගෙන ගියේය.

➢ "රාජ්‍ය යනු මම වෙමි" යන්න ඔහුගේ ප්‍රකාශයකි.

➢ ඔහු රාජ්‍යත්වයට දේවවරම්වාදී උරුමයක් ආරූඪ කළේය.

➢ බලය රජු වෙත කේන්ද්‍රගත කරන ලද දැඩි මධ්‍යගත ආණ්ඩුවක් හ කාර්යක්ෂම පරිපාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම. - ඉන්ටෙන්ඩාන්ට්වරුන්ගේ පරිපාලනය

➢ ශක්තිමත් හමුදා බලයක් පවත්වාගෙන යාම.

- කෝල්බෙයාර් නම් ඇමතිවරයා යටතේ මූල්‍ය පාලනය ක්‍රමවත් කරවීම හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.
- සංස්කෘතික ප්‍රබෝධයක් පැවතීම. Academy of sciences පිහිටුවීම,නාට්‍ය කලාවේ ප්‍රබෝධය හා වර්සායි මාළිගාව.
- ස්පාඤ්ඤයට,ඕලන්දයට හා ශුද්ධ රෝම අධිරාජ්‍යයට එරෙහිව සටහන් කිරීම.
- යාබද ප්‍රදේශ ඈඳාගනිමින් උතුරු ප්‍රංශයේ දේශසීමා පුළුල් කිරීම.

ii) උත්කෘෂ්ට විප්ලවය

- රජු හා පාර්ලිමේන්තුව අතර බලය සඳහා වූ අරගලය.
- ස්ටුවර්ට් වංශික රජවරුන් රජුගේ බලය වර්ධනය කරගැනීමට පාර්ලිමේන්ව නොතකා හැර කටයුතු කිරීම.
- කතෝලිකයන් වූ ස්ටුවර්ට් රජවරු හා රෙපරමාදු භක්තික පාර්ලිමේන්තුවාදීන් අතර ආගමික ප්‍රතිවිරෝධතා ඇති වීම.
- පසුබිම
  - 1642 සිවිල් යුද්ධය
  - 1649 පළමු වන චාල්ස් රජුගේ හිස ගසා දැමීම
  - දෙවන චාල්ස් රජවීම හා ඔහුගේ අත්තනෝමතික පාලනය
  - 1688 විප්ලවය
- ප්‍රතිඵල
  - පාර්ලිමේන්තුවේ අයිතිවාසිකම් තහවුරු වීම.
  - රජුගේ බලය සීමා වීම.
  - 1689 අයිතාවාසිකම් පනත

iii) නව රාජාණ්ඩු

- නව රාජාණ්ඩු වල නැගීම
  - නිශ්චිත දේශ සීමාවකින් සහ නිශ්චිත ජන සංඛාවකින් සමන්විත වූ සමාන භාෂාවක් ව්‍යවහාර කරන පොදු වූ ජාතික අනන්‍යතාවකින් යුක්ත වූ දේශපාලන ඒකකය ජාතික රාජ්‍ය නමින් හැඳින්වේ.

- නව රාජාණ්ඩු බිහිවීමේ පසුබිම
  - නැගී ආ මධ්‍යම පංතියේ ක්‍රියාකාරිත්වය
  - මැකියාවලි, ජීන් බොඩැන් යන දාර්ශනිකයින්ගේ මතවාද
  - පුනරුදයේ බලපෑම
  - වාණිජවාදය
  - ජාතිමාමක අදහස් ප්‍රචලිතවීම

- නව රාජාණ්ඩු වල පොදු ලක්ෂණ
  - නිශ්චිත භූගෝලීය දේශ සීමාවකින් යුක්ත වීම
  - ස්වෛරී රාජාණ්ඩුව
  - ප්‍රාදේශීය නායකයින්ගේ බලය සීමා වීම
  - පෞද්ගලික නිලකාර හමුදා අහෝසි කිරීම
  - රජු ස්ථිර හමුදාවක් පවත්වාගෙන යාම
  - ජාතික නීති පද්ධතියක් බිහි වීම
  - ජාතික බදු ප්‍රතිපත්තිය
  - වැටුප් ලබන නිලධාරි පන්තියක් බිහි වීම

- ප්‍රථමයෙන් ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය මුල් කරගෙන ජාතික රාජ්‍ය බිහිවීම.

iv) තිස් අවුරුදු යුද්ධයේ අවධි

- ජර්මනිය කේන්ද්‍ර කර ගනිමින් ඇරඹුණු මෙම යුද්ධය ජර්මන් රාජ්‍ය වලට පමණක් සීමා නොවී වෙනත් යුරෝපීය රටවල් ද සම්බන්ධ වී වසර 30ක් තරම් දීර්ඝ කාලයක් පැවතීම සඳහා ඉහතින් සඳහන් කළ ආර්ථික, දේශපාලන හා ආගමික හේතු බලපෑවේය.

- තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා හතරකි.
  - බොහීමියානු පැලටයින් අවධිය.(ක්‍රි.ව. 1618 - 1620)
  - ඩෙන්මාර්ක් අවධිය.(ක්‍රි.ව. 1625 - 1629)
  - ස්වීඩන් අවධිය.(ක්‍රි.ව. 1630 - 1635)
  - ප්‍රංශ අවධිය.(ක්‍රි.ව. 1635 - 1648)